# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2489/10 - 2026 මැයි මස 18 වැනි සඳුදා - 2026.05.18**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ඇ.(1) ව්‍යවස්ථාව ප්‍රකාර ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 සඳහා කරනු ලබන සංශෝධන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ඇ.(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පවරා ඇති කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා, රජයේ ආයතනවල භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා ප්‍රසම්පාදනය සම්බන්ධව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට සිදු කරනු ලබන සංශෝධන මෙමගින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2025.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි, 2024.11.25 දින අංක 2412/01 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 සඳහා වන සංශෝධන, පහත උපලේඛනයේ ඇතුළත් කරනු ලැබේ.

එකී සංශෝධන පිළිබඳ අර්ථනිරූපණය හා පැහැදිලි කිරීම්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ අණ පරිදි,

**ඩී. සී. සිරිබද්දන,**
මහලේකම්,
ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව.

2026 අප්‍රේල් මස 09 වැනි දින,

2025.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි, 2024.11.25 දින අංක 2412/01 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 සඳහා පහත සඳහන් සංශෝධන ඇතුළත් කරනු ලැබේ.

**උපලේඛනය**

| *අ/අ* | *පරිච්ඡේදය* | *වගන්තිය* | *සංශෝධනය කළ යුතු මාර්ගෝපදේශ භාෂා මාධ්‍යය* | *යෝජිත සංශෝධනය* |
|---|---|---|---|---|
| 01 | | අර්ථනිරූපණ | සිංහල | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සිංහල අනුවාදයෙහි, "සවිස්තරාත්මක වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම" යන්නෙහි අර්ථනිරූපණයට පසුව "බලාත්මක වන දිනය" යන පහත අර්ථනිරූපණය ඇතුළත් කරනු ලැබේ.<br><br>"බලාත්මක වන දිනය" යන්නෙන් එම දිනය වන විට බලාත්මකව පැවති සියලු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, ප්‍රසම්පාදන අත්පොත සහ අතිරේක මෙන්ම කවර හෝ අදාළ චක්‍රලේඛ සහ නියෝග ප්‍රතියෝජනය කරමින් මෙම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය බලාත්මක වන දිනය අදහස් වේ. බලාත්මකවන දිනය ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන ගැසට් නිවේදනය නිකුත් කිරීමෙන් පසු එළඹෙන දිනයක් විය යුතු ය. |
| 02 | 01.04.05 | අර්ථනිරූපණ සහ 1.5 (අ) වගන්තිය 1.5.4 (අ) වගන්තිය 4.1.1 (අ) වගන්තිය 4.1.4 (ආ) වගන්තිය 5.9 (ආ) | ඉංග්‍රීසි | "Procurement Entity" යන වචන වෙනුවට "Procuring Entity" යන වචන ආදේශ කරනු ලැබේ. |
| 03 | 01 | 1.3.2 (ආ) | ඉංග්‍රීසි | "Officer" යන වචනය වෙනුවට "Official" යන වචනය ආදේශ කරනු ලැබේ. |
| 04 | 02 | 2.8 වගන්තිය ශීර්ෂපාඨය | සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි | 2.8 වගන්තියේ ශීර්ෂපාඨය වෙනුවට පහත ශීර්ෂපාඨය ආදේශ කරනු ලැබේ:<br><br>"ප්‍රසම්පාදන කමිටු. ලංසු ඇගයීම් කමිටු, පිළිගැනීමේ කමිටු, විචලන සමාලෝචන කමිටු සහ ප්‍රසම්පාදන අභියාචන කමිටු සාමාජිකයින් සහ මාණ්ඩලික නිලධාරීන් හා ප්‍රසම්පාදන ක්‍රියාවලියට සහාය වන අනෙකුත් නිලධාරීන් සඳහා ගෙවීම්," |
| | | 2.8 (අ) වගන්තිය | සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි | 2.8 වගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත ඡේදය ආදේශ කරනු ලැබේ:<br><br>ප්‍රසම්පාදන කමිටු (PCs), ලංසු ඇගයීමේ කමිටු (BECs), භාරගැනීමේ කමිටු (ACs), විචලන සමාලෝචන කමිටු (VRCs), සහ ප්‍රසම්පාදන අභියාචන කමිටු සාමාජිකයින් සහ මෙම මාර්ගෝපදේශ යටතේ නිශ්චිතව වගකීම් පවරා ඇති මාණ්ඩලික නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන් වෙත, ඔවුන්ගේ සහභාගිත්වය වෙනුවෙන් ගෙවීම් සිදුකළ යුතු ය. |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *අ/අ* | *පරිච්ඡේදය* | *වගන්තිය* | *සංශෝධනය කළ යුතු මාර්ගෝපදේශ භාෂා මාධ්‍යය* | *යෝජිත සංශෝධනය* |
|---|---|---|---|---|
| 05 | 03 | 3.2 (අ) වගන්තිය | සිංහල | "සැපයීම" යන වචනය වෙනුවට "ඇණවුම" යන වචනය ආදේශ කරනු ලැබේ. |
| 06 | 07 | 7.7 වගන්තිය | සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි | දෙවන අදියර<br><br>පියවර 01 - "කොන්දේසි සහිත" යන වචන වෙනුවට "කොන්දේසි රහිත" යන වචන ආදේශ කරනු ලැබේ. |
| 07 | 08 | 8.2 වගන්තිය | සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි | 8.2 වගන්තිය ඉදිරියෙන් දක්වා ඇති අදාළ කොටුව තුළ අත්පොතට යොමුව ඇතුළත් කරනු ලැබේ. |
| 08 | 11 | 11.3 (ඇ) වගන්තිය | දෙමළ, හා ඉංග්‍රීසි | "shall" යන වචනය වෙනුවට "may" යන වචනය ආදේශ කරනු ලැබේ. |

EOG 05 - 0198

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.